## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්ථයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1** | | |
| (i) ප්‍රමිතයේ 27 හා 28 ඡේද ප්‍රකාරව, ස්ථාවර තැන්පතු 05 කට අදාළ පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු.1,459,334 ක් වැඩියෙන් හා 2020 දෙසැම්බර් 31 දිනට උපචිත පොලී ආදායම රු.4,171,080 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි බව හා ඉදිරි වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පොලී ආදායම ගිණුම් ගත කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට තත්කාර්ය අතුරු අග්‍රිම ගිණුම් 02 ක පැවති රු.29,720 ක බැර ශේෂ එදිනට එම ගිණුම් 33 ක පැවති රු.610,044 ක හර ශේෂවලට එරෙහිවද, සමාලෝචිත වර්ෂය තුළදී ඔසු උයන් දෙකකින් ලැබී තිබුණු රු.2,540,257 ක ආදායම හා රු.6,148,865 ක වෙනත් ආදයම් | මෙම වරද ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |

| | | |
|---|---|---|
| ඔසු උයන් තුනක රු.9,793,701 ක්වූ වියදමට එරෙහිවද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (iii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල අගයන් ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට භාවිතා කරන පරිගණක පද්ධතිය මගින් අගයන් ආසන්න රුපියලට වැටයීමක් කළ නොහැකි බව හා ඉදිරියේදී පරිගණක පැකේජය මෙයට අනුරූපීව සකස් කරන බව. | -එම- |
| (ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2**<br>පහත සඳහන් නිරීක්ෂණවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට රු.192,451,043 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉතිරි තොගවල පිරිවැය, ප්‍රමිතයේ සඳහන් නියමයන්ට අනුකූලව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (i) ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව, ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමය හෝ භරිත සාමාන්‍ය ක්‍රමය යන පිරිවැය සූත්‍ර යොදා ගනිමින් ඉතිරි තොගවල පිරිවැය ගණනය කර ගිණුම්ගත කළ යුතුය. භරිත සාමාන්‍ය ක්‍රමය පදනම් කර ගෙන ඉතිරි තොගවල පිරිවැය ගණනය කර ගිණුම්ගත කර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු නමුත් ප්‍රමිතයේ 27 ඡේදය ප්‍රකාරව කාලීන පදනම මත හෝ එක් එක් මිලදී ගත් අතිරේක බඩු තොග ලැබුණ විට හෝ භරිත සාමාන්‍යය ගණනය කිරීම සඳහා තොග ලෙජර පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට තොග පිරිවැය ගණනය කිරීම සඳහා පරිගණක ගත තොග ලෙජරය පවත්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි බව, සංස්ථාව සතු නිමිද්‍රව්‍ය තොගය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය යටතේ පවත්වා ගෙන නොයන බව හා එලෙස තොග සටහන් කිරීමට ප්‍රමාණවත් පරිගණක පහසුකම් අලෙවි මධ්‍යස්ථානයන්හි නොමැති බව, අමුද්‍රව්‍ය තොග පමණක් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට පවත්වා ගෙන යන බව, ඉදිරියේදී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය අනුව තොග ගණනය කිරීමට කටයුතු කරන බව හා නිමි ද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය තොග පවත්වාගෙන යාම සම්බන්ධව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතය ප්‍රකාරව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමය හෝ භරිත සාමාන්‍ය ක්‍රමය යන පිරිවැය සූත්‍ර වලින් එකක් අඛණ්ඩව අනුගමනය කරමින් නිකුත් කරන තොග අගය කළ යුතු අතර වර්ෂ අවසානයේ තොග ලෙජරයේ ශේෂය ඉතිරි තොගය ලෙස ගිණුම්ගත කළ යුතුය. පරිගණක පහසුකම් නොමැති අංශවල තොග ලෙජර අතින් (manually) පවත්වා ගත යුතුය. |
| (ii) භරිත සාමාන්‍ය ක්‍රමය වෙනුවට 2020 ජනවාරි හා දෙසැම්බර් මාසවල පිරිවැයේ සාමාන්‍ය පදනම් කර ගෙන 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි ඔසු අමුද්‍රව්‍ය, ඉතිරි නිමි ඖෂධ සහ ඉතිරි ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය පිළිවෙලින් රු.70,360,760 ක්, රු.96,833,832 ක් හා රු.21,824,951 ක් ලෙසද, වර්ෂය අවසන් ගැණුම් මිල පදනම් කර ගෙන 2020 දෙසැම්බර් | -එම- | -එම- |

| | | |
|---|---|---|
| 31 දිනට ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.3,431,500 ක් ලෙසද ගණනය කර ගිණුම් ගත කර තිබුණි. | | |
| (iii) 2020 දෙසැම්බර් 31 දිනට පවත්වා තිබුණු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භෞතික ශේෂය තහවුරු කර තිබුණු, එදිනට ඉතිරි ලිපි ද්‍රව්‍ය අයිතම 25 ක පිරිවැය රු.456,700 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර එදිනට පරිගණක උපාංග ඉතිරි තොගයේ පිරිවැය රු.1,947,949 ක් වත්කමක් ලෙස ගිණුම් ගත නොකර ලාභයට එරෙහිව කපාහැර තිබුණි. | මෙම ලිපිද්‍රව්‍ය තොගය වර්ෂ කිහිපයකට පෙර මිලදී ගත් ඒවා බැවින් අදාළ පිරිවැය සොයාගැනීමෙන් පසු පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට නියමිත බව හා පරිගණක උපාංග සම්බන්ධයෙන් නිවැරදි කිරීම් ඉදිරියේදී සිදුකරන බව. | මෙම වැරදි නිවැරදි කළ යුතුය. |
| (iv) පවත්වා තිබුණු ගබඩා 08 කින් ගබඩා 03 කට අදාළව පමණක් සිදුකළ නියැදි පරීක්ෂණයකදී, පිරිවැය රු.842,292 ක් වූ ඔසු අමුද්‍රව්‍ය 20 ක හා පිරිවැය රු.387,590 ක් වූ නිමි ඖෂධ 12 ක තොග ඌනතා සහ පිරිවැය රු.11,734,245 ක් වූ ඔසු අමුද්‍රව්‍ය 20 ක හා පිරිවැය රු.290,222 ක් වූ නිමි ඖෂධ 31 ක තොග අතිරික්තතා පැවති බව අනාවරණය විය. නමුත් එම තොග ඌනතා හා අතිරික්තතා ගිණුම්ගත කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 103, 104 හා 105 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙනද නොතිබුණි. | 2019 වර්ෂයේ තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති බව, කොරෝනා ව්‍යවසනය හේතුවෙන් පැණනැගුනු තත්ත්වයන් තුළ 2020 වර්ෂයේ තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම ප්‍රමදවූ බව හා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | භෞතික සමීක්ෂණවලදී අනාවරණය වූ තොග ඌනතා හා අතිරික්තතා ගිණුම් ගත කර මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගය තුළ ඇතුළත් හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ තොගයේ පිරිවැය රු.7,301,072 ක් ලාභයට එරෙහිව කපාහැරීමට හා මුදල් රෙගුලාසි 103,104 හා 105 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවී තිබුණු හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ ඒකක 19,516 ක, ලිපි ද්‍රව්‍ය ඒකක 671 ක සහ ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 177 ක පිරිවැය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණු අතර ඇසුරුම් ද්‍රව්‍ය තොග වල ඇතුළත් හානි වූ හා කල් ඉකුත් වූ තොගය ගණනය කර හෝ නොතිබුණි. | ඉතිරි නිමි ඖෂධ තොගය තුළ අලෙවි මධ්‍යස්ථාන හා සංස්ථාවේ 07 හා 08 ගබඩාවන්හි භාවිතයට ගත නොහැකි හා කල් ඉකුත් වූ තොග ඇතුළත් බව, 2021 වර්ෂය තුළදී 07 හා 08 ගබඩාවන්හි භාවිතයට ගත නොහැකි හා කල් ඉකුත් වූ තොග විනාශ කළ බව, 2021 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කරන බව හා ගබඩාවන් තුළ පවතින වසර ගණනාවක සිට පැවත එන භාවිතයට නොගන්නා පැරණි අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය (ලේබල්), ලිපි ද්‍රව්‍යන් සඳහා පරිගණක පද්ධතිය තුළ මිල ගණන් | හානි වූ හා කල් ඉකුත් වූ තොගවල පිරිවැය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමටත්, විධිමත් පරිදි අපහරණය කිරීමටත්, එම තොග කපාහැරීමට හා අදාළ අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහන් නොවන බැවින් ඒවායේ පිරිවැය හඳුනාගත් පසු නිවැරදි කිරීම් සිදුකරන බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 14 ඡේදයේ (අ) හා (ආ) වගන්තිවල දැක්වෙන කොන්දේසිවලට පටහැනිව, ඉකුත් වර්ෂය දක්වා අනුගමනය කළ තොග ආගණන ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේදී වෙනස් කර තිබුණු අතර ප්‍රමිතයේ 29 ඡේදය ප්‍රකාරව ප්‍රතිපත්තිය වෙනස් කළ බව හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී අලෙවි මධ්‍යස්ථාන 22 ක ණයට විකුණුම් රු.7,763,620 ක් ගිණුම් ගත කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | අනුරාධපුර මැදවච්චිය පිහිටි ඔසු උයන සංවර්ධනය කර මායිම් වැට ඉදිකිරීම සඳහා වැයකර තිබුණු රු.1,808,795 ක් ප්‍රාග්ධනිත කළ යුතු වුවද, ඒ වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වැය කළ වියදම ඉදිරි ගිණුම් කාලපරිච්ඡේදයේදී ක්‍රමක්ෂය කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඇ) | මුළු පිරිවැය රු.5,376,250 ක් වූ ස්වයංක්‍රීය ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඉකුත් වර්ෂයේදී එම මුදල අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම යන්ත්‍රය සපයා සවිකර තිබුණු නමුත් පිරිවැය ප්‍රාග්ධනගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම් පොත්වලට ගන්නා බව. | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයේ ආදායම් බදු වියදම රු.820,104 කින් අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා මෙම වරද 2021 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට තොග හානි සඳහා ප්‍රතිපාදනය රු.8,373,176 ක් විය යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව එම ප්‍රතිපාදනය රු.11,179,466 ක් වූයෙන් වෙනස රු.2,806,290 ක් විය. එසේම මහජන බැංකුවේ ශේෂ සනාථ සහතිකවලට අනුව ඉතිරි කිරීමේ ගිණුම් දෙකක 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,574,664 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව එය රු.4,210,243 ක් වූයෙන් වෙනස රු.1,364,421 ක් විය. තවද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පොදු වියදම් අත්තිකාරම් ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය සහ ලෙජර් ගිණුමේ 2020 ජනවාරි 01 දිනට ශේෂය අතර රු.5,458,141 ක වෙනසක් පැවතුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු 2020 දෙසැම්බර් 31 දිනට රු.9,927,344 ක් වූ ශේෂය තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් උපලේඛන පිළියෙළ කර නොතිබුණි. එසේම හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබුණු රු.8,906,193 කින් රු.6,047,654 ක් ජර්නල් සටහන් මගින් තහවුරු නොකෙරුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, රු.2,806,290 ක වෙනස හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ සමුච්චිත ලාභයට ගැලපිය යුතු බැවින් ඉදිරියේදී එය නිවැරදි කරන බව, හඳුනා නොගත් තැන්පතු නිසා ඇති වූ රු.1,364,421 ක වෙනස හඳුනා ගැනීමෙන් පසු නිවැරදි කරන බව, පොදු වියදම් අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.9,9273,344 ක් සඳහා උපලේඛන හා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාළ ගැළපුම් රු.6,047,654 කට අදාළ තොරතුරු මේ වන විට සකස් කරමින් පවතින බව හා ඉදිරියේදී එම තොරතුරු ලබාදීමට කටයුතු කරන බව. | වැරදි නිවැරදි කළ යුතු අතර අදාළ තොරතුරු හා ජර්නල් සටහන්ද විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.23,819,450 ක් වූ උපචිත වියදම් තුළ ඇතුළත් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද රු.14,162,022 ක නිරවුල් නොකළ බැර ශේෂ හා නොගෙවන ලද මුද්දර බදු රු.260,839 ක නිවැරදිබව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා 2020 දෙසැම්බර් 31 දිනට රු.14,162,022 ක බැර ශේෂ වලට අදාළව හා රු.260,839 ක මුද්දර බදු වලට අදාළ තොරතුරු ඉදිරි කාලයේදී ලබා දෙන බව. | නිරවුල් නොකළ ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. එම නිවැරදි කිරීම්වලට අදාළ ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහතින් දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 166 | මුදල් සමඟ ලැබෙන අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම සහ විධිමත් සටහන් තබා නොගැනීම හේතුවෙන් වර්ෂයකට වඩා පැරණි ලැබීම් රු.268,135 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා මෙම පැරණි ලැබීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 382 | බැංකු ගිණුම් 2 ක තැන්පත් කිරීමට යවා තිබුණු නමුත් ගිණුමට බැර නොවූ රු.351,871 ක් වටිනා වර්ෂයකටත් වඩා පැරණි චෙක්පත් 6 ක් සම්බන්ධයෙන් පරීක්ෂාකර අදාළ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට 2020 දෙසැම්බර් 31 දින දක්වාම බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | පෙර සිට පැවත එන නිරවුල් නොවූ ශේෂයක් වන බව, මේ සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බැවින් මෙම ශේෂය බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා ඇති බව හා තවදුරටත් මේ පිළිබඳව හඳුනාගැනීම් සිදුකර ඉදිරි පියවර ගන්නා බව. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 383 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂයකටත් වඩා වැඩි කාලයක සිට හඳුනාගැනීමට නොහැකි වූ ගිණුමට සෘජුවම ලැබී තිබුණු රු.683,636 ක් හඳුනාගෙන පොත්වලට ගැනීමට කටයුතු නොකර ඒ වෙනුවට 2020 දෙසැම්බර් 31 දින දක්වාම බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | සංස්ථාවේ බැංකු ගිණුම් වෙත සෘජුවම මුදල් තැන්පත් කිරීම් කිහිපයක එකතුවක් වන බව හා ඉදිරිපත්වී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීම මත තැන්පත්කරුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වීමෙන් මුදල් රෙගුලාසි 383 පරිදි කටයුතු කළ නොහැකිව පවතින බව. | තැන්පත්කරු හඳුනාගත නොහැකි නම් මුදල රජයේ ආදායමට බැර කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 396 | වර්ෂයකටත් වඩා පැරණි නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.15,236 ක චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු නොකර 2020 දෙසැම්බර් 31 දින දක්වාම බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | වසර 10 ඉක්මවූ කාලයක සිට පැවත එන හඳුනා ගත නොහැකි ශේෂයක් වන බව හා මේ සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1702/5 දරන 2011 අප්‍රේල් 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 05 වන උපලේඛනය | තොග පොත්වලට අනුව 2020 ජූලි 27 දිනට තල තෙල් කිලෝග්‍රෑම් 9,019 ක් පැවති නමුත් එදින සිදුකරන ලද භෞතික පරීක්‍ෂාවේදී තල තෙල් කිලෝග්‍රෑම් 8,922 ක් පමණක් ගබඩාවේ තිබුණු බව තහවුරු වූයෙන් පිරිවැය රු.53,253 ක් වූ තල තෙල් කිලෝග්‍රෑම් 97 ක තොග ඌනතාවයක් පැවැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 හා 105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තල තෙල් සම්බන්ධව පැවති කිලෝ 97 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 හා 105 ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ කමිටු නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත්කර ඇති බව. | අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය කඩිනමින් ලබාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද ආයතන සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය, දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම, එය ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම යනාදී විස්තර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා අඩුපාඩු හඳුනාගනිමින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව. | චක්‍රලේඛ විධිවධාන ප්‍රකාරව 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාල රාමුව තුළ විධිමත් පරිදි පිළියෙල කළ යුතු අතර එයට අනුගත වන පරිදි ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය. |
| (ඈ) | 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | යම් සේවාදායකයකු පාරිතෝෂික අරමුදල් ලබා ගැනීමට සුදුසුකම් ලද පසුව හැකි ඉක්මනින් ඔහුට අදාළ මුදල් ලබාදීමට වාර්ෂිකව ගණනය කරන ලද පාරිතෝෂික අරමුදලට සමාන මුදලක් ආයෝජනය කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා ඉදිරියේදී විධිමත් ආයෝජනයක් සිදු කිරීමට කටයුතු කරන බව. | පාරිතෝෂික අරමුදලට සමාන මුදලක් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ 06 කදී මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු මුළු දිරි දීමනාවල එකතුව රු.474,979,883 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන දිරි දීමනා ගෙවා ඇති බව හා මේ වන විට නව දිරි දීමනා ක්‍රමයක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව භාණ්ඩාගාර අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | විධිමත් අනුමැතිය ලබා ගත් දිරිදීමනා යෝජනා ක්‍රමයක් මත පමණක් දිරිදීමනා ගෙවිය යුතුය. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 | සමාලෝචිත වර්ෂය තුළදී රු.37,277,148 ක් වැයකර තල තෙල් ඇතුළු ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීම් කිහිපයකදී සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර විධිමත් ප්‍රතිග්‍රහන ලිපි යැවීමට ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි. | මිලදී ගැනීම් කිහිපයකදී සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම් අත්සන් නොකිරීම හා ප්‍රතිග්‍රහන ලිපි යැවීමට කටයුතු නොකිරීමේ දුර්වලතා මගහරවා ගැනීමට විශේෂ අවධානය යොමුකර ඇති බව හා COVID 19 වසංගත තත්ත්වය හමුවේ විටින් විට නිකුත්කළ චක්‍රලේඛන මත හැකි උපරිම අයුරින් විධිමත්ව ප්‍රසම්පාදන අනුමැතියන් යටතේ කටයුතු කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 6.10 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 0.65 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 5.45 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.මිලියන 29.32 කින් අඩු වුවද, ස්ථාවර තැන්පතු මත මූල්‍ය ආදායම් රු.මිලියන 18.7 කින් වැඩිවීමත්, විකුණුම් පිරිවැය, පරිපාලන වියදම් සහ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පිළිවෙළින් රු.මිලියන 13.4 කින්, රු.මිලියන 15.7 කින් සහ රු.මිලියන 9.8 කින් අඩුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

------------------------------------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලෙවි ආදායම සියයට 4.15 කින්ද, විකුණුම් පිරිවැය සියයට 2.7 කින්ද හා වෙනත් ආදායම් සියයට 72 කින්ද අඩු වී තිබුණු අතර මූල්‍ය ආදායම සියයට 18.7 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 1 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 0.8 කින් අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ 1: 6.03 ක් වූ ජංගම වත්කම් අනුපාතය සමාලෝචිත වර්ෂයේ 1: 5.86 දක්වා අඩුවී තිබුණු අතර ක්ෂණික වත්කම් අනුපාතය 1: 4.36 සිට 1:4.09 දක්වා අඩුවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තොග පිරිවැටුම් අනුපාතය 5.11 සිට 4.83 දක්වා අඩුවීම හේතුවෙන් තොග රඳවා ගැනීමේ කාලය දින 71 සිට 76 දක්වා දින 5 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ නිෂ්පාදනය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් මුළු පිරිවැය රු.45,361,388 ක් වූ නව යන්ත්‍ර 4 ක් සපයා සවි කිරීමේ කොන්ත්‍රාත්තුව 2019 ජූලි 03 දින ප්‍රදානය කර තිබුණි. නමුත් ඉන් පිරිවැය රු.26,544,603 ක් වූ ස්වයංක්‍රීය බෝතල් පිරවුම් යන්ත්‍රය මුල්‍ය ප්‍රතිපාදන සපයාගෙන නොතිබීම හේතුවෙන් මිලදීගෙන නොතිබුණි. ස්වයංක්‍රීය පැකට් පිරවුම් යන්ත්‍රය, ස්වයංක්‍රීය පෙති සැකසුම් යන්ත්‍රය සහ ස්වයංක්‍රීය ප්‍රාථමික ඇඹරුම් යන්ත්‍රය යන යන්ත්‍ර 3 ක් සපයා සවිකිරීමට කොන්ත්‍රාත් ප්‍රදානයෙන් පසු වර්ෂකට ආසන්න කාලයක් ගතකර තිබුණු නමුත් සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කළ නොහැකිව තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා යන්ත්‍ර 03 සැපයීමේ ප්‍රමාදයට කොවිඩ් වසංගත තත්වයද බලපා ඇති බව. | ප්‍රසම්පාදන නීතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 ජනවාරි 01 දිනට පිරිවැය රු.2,319,609 ක ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගයක් පැවතියදී සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.1,283,718 ක ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.3,431,501 ක ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගයක් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.171,827 ක ලිපි ද්‍රව්‍ය පමණක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. අවශ්‍යතාවය නිසි පරිදි හඳුනානොගෙන අතිරික්ත මිලදී ගැනීම් නිසා ඉතිරි ලිපි ද්‍රව්‍ය තොග හානිවීමේ හා කල් ඉකුත්වීමේ තත්ත්වයට පත්වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, වර්ෂයේ ආරම්භක තොගය හා ප්‍රවර්තන වර්ෂයේ අවශ්‍යතාව අනුව නව තොග මිලදී ගත් බව, සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රශස්ථ ලිපිද්‍රව්‍ය තොගයක් අවශ්‍ය බව, කෙසේ වුවද අතිරික්ත හෝ අත්‍යාවශ්‍ය තොග මට්ටමක් පවත්වා ගැනීම සම්බන්ධව තවදුරටත් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගබඩා තුළ ක්‍රමවත් ලෙස තොග ගබඩාකර නොතිබුණු අතර උපරිම, අවම හා යලි ඇණවුම් තොග මට්ටම් පවත්වා නොතිබුණු බවත්, සෙමින් චලනය වන තොග පැවති නමුත් එම අයිතම හඳුනා ගැනීමට හා අලෙවිය සඳහා අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණු බවත්, ඖෂධවල මිල වැඩිවීම, ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කර තිබුණු කල්තබා ගත හැකි ඖෂධ වර්ග කල් ඉකුත් වූ ඖෂධ සමඟ එකට ගබඩාකර තිබුණු බවත්, එම තොග නැවත ලේබල් කර අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කල් ඉකුත් වීමට ඉඩ හැර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල හා ගබඩාවල පවතින කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග දීර්ඝ කාලයක සිට තොග පොත්වලින් ඉවත් නොකර සාමාන්‍ය තොග ලෙස ගණනය කර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල විශාල ඉඩ ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවති බවත්, මාතර, මහනුවර, මාතලේ, අලෙවි මධ්‍යස්ථානයන්වල හා සංස්ථාවේ සිදු කරන ලද භෞතික තොග සමීක්ෂණ අනුව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, නිමි ඖෂධ ගබඩාවල පවතින සීමිත ඉඩකඩ ප්‍රශස්ත ආකාරයෙන් භාවිතා කිරීමට හැකි වන පරිදි රාක්ක පද්ධතිය නවීකරණය කිරීමට කටයුතු යොදා ඇති බව, 007 ගබඩාවේ මෙම කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව, 008 ගබඩාවේද පවතින ඉඩ ප්‍රමාණය වැඩි කිරීම සඳහා වෙනම කොටසක් ඉදි කර ඇති බව, උපරිම , අවම සහ යලි ඇනවුම් තොග මට්ටම් අදාළ අංශ සමග සාකච්ඡා කර සකස් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව, සෙමින් චලනය වන තොග අලෙවි කිරීම සඳහා කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය හමුවේද අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සිදු කිරීමට කටයුතු කර ඇති බව, 08 ගබඩාවේ කල් නිකුත් වූ ඖෂධ නිසි පරිදි හඳුනාගෙන ඉවත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇති බව හා ඌන උපයෝගිතා පවතින අලෙවි මධ්‍යස්ථානයන්හි වෛද්‍ය සායන ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කෙරුන ද ගෝලීය කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් එම කාර්යය අඩපන වූ බව. | ගබඩා පරිපාලනය විධිමත් කළ යුතුය. |
| (ඈ) | අනුරාධපුර පිහිටි ඔසු උයන සංවර්ධනය කර මායිම් වැට ඉදිකිරීම සඳහා රු.1,808,795 ක් වැයකර තිබුණු නමුත් එම ඉඩම විධිමත් පරිදි සංස්ථාවට පවරාගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම සංස්ථාවට ලබාදීමට තීරණය කර ඇති බව දන්වා ඇති නමුත් මෙතෙක් විධිමත් පැවරීමක් සිදුකර නොමැති බව හා වැයකර ඇති වියදම ඉදිරි ගිණුම් කාලපරිච්ඡේදයේදී ක්‍රමක්ෂය කරන බව. | ඉඩම විධිමත් පරිදි සංස්ථාවට පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 77 කින් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 333 ක් වූ ප්‍රාග්ධන ප්‍රසම්පාදන 19 කට අදාළව කිසිදු කාර්යයක් ඉටු කර ගැනීමට අපොහොසත්වී තිබුණි. රාජ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබීමත්, පැවති කොරෝනා වසංගත තත්ත්වයත් මේ සඳහා හේතු වූ බවට සභාපති විසින් අදහස් දක්වා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ප්‍රමාණවත් රාජ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබීමත්, පැවති කොරෝනා වසංගත තත්ත්වයත් හේතුවෙන් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සියල්ලම ඉටු කිරීමට හැකියාව නොලැබුණු බව. | ක්‍රියාකාරී සැලසුමට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ විකුණුම් ආදායම රු.676,304,359 කින් රු.504,447,317 ක් හෙවත් සියයට 75 ක් රාජ්‍ය අංශය මගින් ලැබී තිබුණු අතර රු.171,857,042 ක් හෙවත් සියයට 25 ක් පමණක් පෞද්ගලික අංශය මගින් ලැබී තිබුණි. නිරායාසයෙන් ලැබෙන රාජ්‍ය අංශයේ ඉල්ලුම කෙරෙහි ඇති වැඩි නැඹුරුවීමත්, වෙළඳපොළ අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගැනීමත්, නව අලෙවි ක්‍රම උපායන් භාවිතා නොකිරීම සහ ප්‍රචාරණය ප්‍රමාණවත් නොවීමත් පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම අඩුවීමට හේතුවී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කාර්තු දෙකක් සමස්ථ රටම අකර්මණ්‍යා වී පැවතුණු බව, මෙම කාලසීමාවේ මානව සම්පතෙහි හිඟතාවය හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතා මත සැපයුම් ක්‍රියාවලියේ බිඳවැටීම සහ අලෙවි මධ්‍යස්ථානයන් වසා තැබීමට සිදුවීම වැනි හේතූන් මත සමස්ථ මෙහෙයුම් පද්ධතියෙහි අකර්මන්‍ය වීමක් සිදුවූ බව, එසේවුවද 2019 පෞද්ගලික අංශයේ සමස්ථ අලෙවි ආදායමට සාපේක්ෂව 2020 වර්ෂය තුළදී සියයට 25 කින් අලෙවිය වර්ධනය කර ගැනීමට හැකිවූ බව, සංස්ථාවේ අලෙවි තත්වය සලකා බලා මුල් මාසයන් තුළදී ප්‍රචාරණ මාධ්‍යයන් තුළ අලෙවි ප්‍රචාරණයන් සිදු නොකළ බව, වර්ෂයේ අග මාසයන්හිදී අලෙවියේ සිදු වූ වර්ධනයත් සමග ආරෝග්‍යා මාසික සඟරාවෙහි "ගිනිහල්ගෙය" පුවත්පත් අතිරේකයේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා දැන්වීම් පළ කළ බව, කොරෝනා වෛරස තත්වය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් නව නිෂ්පාදන පෙළක් එළි දැක්වීමේ උළෙලක් සෞඛ්‍ය අමාත්‍යතුමියගේ සහභාගිත්වයෙන් පැවැත් වූ බව හා එහිදී මුද්‍රිත, ගුවන් විදුලි හා රූපවාහිනී යන මාධ්‍යන් තුනම ආවරණය වන පරිදි අලෙවි ප්‍රචාරණයන් නොමිලේම සිදුකර ගැනීමට සමත්වූ බව. | පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය අංශය වෙත නිෂ්පාදන වර්ග 134 කට අදාළ ඉල්ලුම සපුරාලිය නොහැකිවීම | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, රාජ්‍ය අංශයේ අභිමි අලෙවි ආදායම අවමකර ගැනීම සඳහා උපරිම වශයෙන් ක්‍රියාකරන බව, පසුගිය වර්ෂවල ඉල්ලුම | රාජ්‍ය අංශය වෙතින් ලැබෙන ඉල්ලුම ප්‍රශස්ථ මට්ටමින් |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් සංස්ථාවට අහිමි වී තිබුණු ආදායම රු.79,614,405 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එලෙස අහිමිවී තිබුණු ආදායම රු.78,372,900 ක් විය. අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරවම රාජ්‍ය අංශයෙන් ලැබෙන මෙම ඉල්ලුම සපුරාලිය නොහැකිවීම තුළින් නිශ්චිත වෙළඳපොල කොටස අත්හැරීයාමේ අවදානමක් පැවතුණි. | හා නව වෙළඳපල අත්පත්කර ගැනීම සැලකිල්ලට ගෙන ඉලක්ක ලඟාකරගත හැකි ආකාරයට නිෂ්පාදන සැලැස්ම සකස් කරන බව, රාජ්‍ය අංශයේ අහිමි ආදායම අවම කර ගැනීම උදෙසාම සභාපතිගේ මූලිකත්වයෙන් 2021 වර්ෂය සඳහා නිෂ්පාදන සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීමද මාසිකව සිදු කළ බව. | සපුරාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ඉදිරි වර්ෂවලට අදාළව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව හා සියලුම අංශ විසින් අලෙවිය හා නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඉටුකරන කාර්යන් පිළිබඳව කාර්යසාධන දර්ශක පිහිටුවා කටයුතු කිරීමට ඉදිරි වර්ෂයේ සිට කටයුතු කරන බව. | සංස්ථාවේ එක් එක් අංශයන්හි ක්‍රියාවලීන්හි කාර්යසාධනය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| (ඉ) | සංස්ථාව විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරඟකාරී ආයතන අතර සංස්ථාවේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වෙළඳපල කොටස හඳුනාගැනීමට සහ නව පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් වන පරිදි වෙළඳපල ප්‍රවනතා හඳුනාගනිමින් අවශ්‍ය නිෂ්පාදන සංකල්ප හඳුනාගැනීම සඳහා වෙළඳපල සමීක්ෂණයක් කොරෝනා වසංගත තත්වය අවසන් වූ විගස සිදු කිරීමට නියමිත බව හා ඒ සඳහා අවශ්‍ය සමීක්ෂණ පත්‍රිකා ආදී මූලික කටයුතු මේ වන විටත් පිළියෙල කර ඇති බව. | සංස්ථාවේ වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම පිණිස නව පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් වන පරිදි වෙළඳපල ප්‍රවනතා හඳුනාගැනීමට සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඊ) | 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, මීට පෙර අවස්ථා කිහිපයකදී මී පැණි නිෂ්පාදනය කිරීම ඉලක්ක කර ගනිමින් සංස්ථාව සතු ඔසු උයන්වල මී පැණි පෙට්ටි ස්ථාපිත කළද එම වැඩසටහන අසාර්ථක වූ බව, මී පැණි නිෂ්පාදනය පිළිබඳව විශේෂ අවධානය යොමුකර විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට කටයුතු සූදානම් කර ඇති බව, ගම්පහ දිස්ත්‍රික්කයේ ආයුර්වේද වෛද්‍ය සංරක්ෂණ සභාවල සාමාජික වෛද්‍යවරුන් 100 ක් තෝරාගෙන ඔවුන් වෙත ජනපද සහිත මී මැසි පෙට්ටි 100 ක් ලබාදී මී පැණි නිෂ්පාදනය කර සංස්ථාවට සපයාගැනීමට කටයුතු කරන බව, ව්‍යාපෘතියට අදාළ වෛද්‍යවරුන් මේ වන විටත් හඳුනාගෙන අවසන් බව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මී පැණි නිෂ්පාදන ක්ෂේත්‍රයේ | සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හෝ ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල වන සේ අරමුණු සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

නියුතු විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් හා ආයතනවල සහාය මේ සඳහා යොදා ගන්නා බව, මෙම ව්‍යාපෘතිය සංස්ථාව සතු ඔසු උයන්වල ක්‍රියාත්මක කිරීමටද අපේක්ෂා කරන බව හා එළඟිතෙල් හා එළකිරි ලබාගැනීමට අදාළ ගව පට්ටි පවත්වාගෙන යාම සම්බන්ධව ඉදිරියේදී විශේෂ අවධානය යොමු කරන බව.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්යමණ්ඩලය 375 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 316 ක් වූයෙන් තනතුරු 63 ක් පුරප්පාඩුව පැවතුණු අතර, ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ තනතුරු 02 ක්ද, මධ්‍යම කළමණාකරන මට්ටමේ තනතුරු 02 ක්ද, කනිෂ්ඨ කලමණාකරණ මට්ටමේ තනතුරු 04 ක් ද, කලමණාකාර සහකාර තාක්ෂණික මට්ටමේ තනතුරු 05 ක්ද, කලමණාකාර සහකාර මට්ටමේ තනතුරු 14 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 25 ක්ද උක්ත පුරප්පාඩු 63 ට අයත් විය. අවශ්‍යතාවය පරිදි මෙම පුරප්පාඩු විධිමත්ව පිරවීමට කටයුතු කර නොතිබුණු අතර වර්ෂ ගණනාවක සිට ප්‍රධාන වෛද්‍ය නිලධාරී, වැඩ මූලික සහ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් සිදු කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ප්‍රධාන වෛද්‍ය නිලධාරී තනතුර සඳහා අවස්ථා 03 කදී අයදුම්පත්‍ර කැඳවූවද සුදුසු අයදුම්කරුවකු ඉදිරිපත් නොවූ බව, සුදුසුකම් සංශෝධනය කිරීමට කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළද සුදුසුකම් සංශෝධනය නොකළ බව, එම තනතුරේ වැඩබැලීමට පත්කළ වෛද්‍යවරිය එම තනතුරේ කටයුතු නිසියාකාරව ඉටුකරන බැවින් ඇයට පුද්ගලික වනසේ තනතුර ස්ථිර කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව, සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වැඩ මූලික තනතුර සඳහා බාහිර බඳවාගැනීම් කළ නොහැකි බව, ප්‍රාථමික සේවා ගණයේ II ශ්‍රේණියේ වසර 05 ක සේවා පළපුරුද්ද ඇති අභ්‍යන්තර සේවකයින්ගෙන් තෝරා ගත යුතු බව, අයදුම්පත් කැඳවූ සේවකයින් අදාළ සේවා කාලය සපුරා නොතිබීම හේතුවෙන් ස්ථිරව පත්නොකර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය තනතුරක් වන බැවින් ආසන්නතම සුදුසුකම් සම්පූර්ණ කළ අයට වැඩබැලීමේ පත්වීම් ලබාදී ඇති බව, අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට නියමිත බව, යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා 2019 ජූලි 31 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී එක් සේවකයකු වැඩබැලීමට පත් කර ඇති බව හා මේ වන විට යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති බව. | අනුමත කාර්යමණ්ඩලය විධිමත්ව සම්පූර්ණ කර කාර්යසාධනය වැඩි කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09 ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බඳවාගැනීම් පටිපාටියක් අනුමත කර තිබුණු නමුත් එම සේවා ගණ යටතට අයත් තනතුරුවලට බඳවාගන්නා ලද සියළුම නිලධාරීන්ට බඳවාගැනීම් | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, මෙම සංස්ථාවේ ආරම්භයේ සිට මේ දක්වා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොමැති බව, මේ දක්වා සේවයේ ස්ථිර කිරීම් කර ඇත්තේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමෙන් තොරව බව, 2022 වර්ෂය අවසන්වීමට පෙර අදාළ සියලු කාර්යමණ්ඩලය සඳහා කාර්යක්ෂමතා ඇගයීම් සිදුකිරීමට පියවර ගන්නා බව හා අදාළ | අදාළ බඳවාගැනීමේ පටිපාටි අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි පරිදි පැවැත්වීමට |

| | | |
|---|---|---|
| පටිපාටියේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පැවැත්වීමකින් තොරව සේවයේ ස්ථිර කර තිබුණි. | ඇගයීම් අනුව සේවක ස්ථිර කිරීම්, උසස්කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------------

**4.1 තිරසාර සංවර්ධන අරමුණු**

--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව මෙම සංස්ථාවේ කාර්යභාරයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක ළඟාකර ගැනීම සම්බන්ධව හා ආයතනික ඉලක්ක ළඟාකර ගැනීමේ දර්ශක සම්බන්ධවද විශේෂ අවධානය යොමුකරමින් ඉදිරි කටයුතු සිදුකරන බව හා 2022-2026 කාලසීමාවට අදාළ ආයතනික සැලැස්ම හා 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී මේ සම්බන්ධව අවධානය යොමුකරන බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. . |